**ඉඩම් මැනුම් සභාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ පමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

ඉඩම් මැනුම් සභාවේ 2006 අප්‍රේල් 02 දිනැති අංක එල්එස්/සී/සීඅයිආර්/02/2006 දරන චක්‍රලේඛය ප්‍රකාරව බලයලත් මිනින්දෝරුවරුන් විසින් යම් බිම් කොටසක හිමිකම පැවරීම සඳහා හෝ යම් මායිමක් වෙනස් කිරීම සඳහා සකස් කරනු ලබන පිඹුරක් හෝ සිතියමක සහතික පිටපතක් එම පිඹුරු සහතික කරන ලද දිනයේ සට දින 30 ක් ඇතුලත දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවල තැන්පත් කර තැබිය යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් කටයුතු වල රු. 1,429,573 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයෙ අතිරික්තය රු. 1,050,797 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 378,776 ක හෙවත් සියයට 36 කින් මූල්‍ය පතිඵලයේ වර්ධනයක් ඇතිවී තිබුණි. මිනින්දෝරුවරුන් සඳහා නිකුත් කළ බලපත්‍ර ආදායම වැඩිවීම, මිනිනදෝරුවරු ලියාපදිංචි කිරීමේ ආදායම ඉහළ යාම සහ බැංකු පොලී ආදායම වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

2002 අංක 17 දරන මැනුම් පනතෙහි සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 37 (අ) වගන්තිය

ඉඩම් මැනීම් කටයුතුවල නියුතු තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙනයාම සභාවේ ප්‍රධාන අරමුණක්ව තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී විසඳිය යුතුව තිබූ බලය නොලත් පුද්ගලයින් සකසන මැනුම් පිඹුරු හා මිනින්දෝරුවන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව 88 ක් විය. එයින් පැමිණිලි 70 ක් සඳහා විසඳුම් ලබා දී තිබූ අතර තවදුරටත් පැමිණිලි 18 ක් සඳහා විසඳුම් ලබාදිය යුතුව තිබුණි.

(ආ) 37 (ඇ) සහ (ඉ) වගන්ති

2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මෙහි වෘත්තීය සංවර්ධන වැඩසටහන් 05 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 06 ක් පැවැත්වූ බව සඳහන් කර තිබුණද, ඉඩම් මැනුම් සභාව මගින් සත්‍ය වශයෙන් පවත්වා තිබුණෙ වැඩසටහන් 02 ක් පමණක් බවත් ඉතිරි වැඩසටහන් 04 මිනින්දෝරු දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද ඒවා බවත් නිරීක්ෂණය විය.

(ඇ) 37 (ඊ) සහ (උ) වගන්ති

මිනින්දෝරු වෘත්තිය හා සම්බන්ධ සුදුසු කම් ලැබීමේ විභාග පැවැත්වීම, අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයන් ස්ථාපිත කිරීම සඳහා විදේශ රටවල බලධරයන් සමග එකඟතාවක් ඇතිකර ගැනීම වැනි කරුණු අරමුණු කරගෙන තිබූ නමුත් ඒවා ඉටුකර ගැනීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඉ. මැ. ස. /5/501 ලිපගොනුවට අදාලව රජයේ ඉඩම් ව්‍යාජ ඔප්පු මගින් රාජසන්තකයෙන් බැහැර කිරීමේ චෝදනාවකට ලක්වූ බලයලත් මිනින්දෝරුවරයකුට විරුද්ධව නීතමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2011 ජූලි 03 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් දන්වා තිබුණද මෙතෙක් එම නිලධාරියා සම්බන්ධයෙන් විමර්ශණයක් පැවැත්වීමට හෝ සභාව අපොහොසත්ව තිබුණි. තවද ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ 2012 ජූලි 12 දිනැති ලිපිය මගින්ද චූදිත මිනින්දෝරුවරයා රජයේ ඉඩම් සඳහා පෞද්ගලික පිඹුරක් පිළියෙල කරන ලද තවත් අවස්ථාවක් දක්වා තිබ අතර ඊට එරෙහිව ද පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවේ මුදල් පොත පරිගණකගත වැඩසටහන් මගින් පළියෙල කිරීම සඳහා සුදුසු පරිගණක මෘදුකාංගයක් උපයෝගී කරගෙන නොතිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ)** ඉඩම් මැනුම් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 04 කි. එනම් ලේකම් තනතුරු - 01, පරිගණකදත්ත සටහන් කරු / ලිපිකරු තනතුරු - 02 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු - 01 ක් වශයෙන් වුවද ගිණුම් විෂයය හා සභාවේ අරමුණු සහ කාර්‍යයන් වලට අයත් නීති විෂයය සම්බන්ධයෙන් තනතුරු ඇති කර නොතිබුණ.

**(ආ)** සභාවේ 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව තිබෙන ලේකම් තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත් කිරීමට කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් කර තිබූ ඉල්ලීමට අනුමැතිය දී තිබුණි. 2009 ජනවාරි මස සිට වැඩබැලීම සඳහා නිලධාරියෙකු පත්කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන තුරු ස්ථිර නිලධාරියෙකු පත්කිරීමට කටයුතුකර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන් ලියාපදිංචි කර ගැනීමේ ඉලක්කය 100 ලෙස දක්වා තිබුණත් මිනින්දෝරුවරුන් 55 ක් ලියාපදිංචි කරගෙන තිබුණි.

**4.2 අයවැය පාලනය**

2012 වර්ෂයේ සභාව වෙනුවෙන් අය වැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර, වියදම් ඇස්තමේන්තුවක් පමණක් පිළියෙල කර තිබුණි.

**4.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.**

මැනුම් සභාවේ ලියාපදිංචි වී තිබූ මිනින්දෝරුවරයකු නම් දෙකක් භාවිතා කරමින් පිඹුරු පිටපත් සකස් කර තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර මේ හේතුවෙන් පිඹුරුපතේ සඳහන් නමට ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප වන බවත් එවැනි පිඹුරු පිටපත්වල නීත්‍යානුකූලභාවය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රචාරණ කටයුතු.